# <u>සිංහල සාහිත්‍ය සංග්‍රහය</u>

# <u>කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට...</u>

ශ්‍රේණිය : 11
වාරය : දෙවන වාරය
නිපුණතාව : 14.0 සාහිත්‍ය නිර්මාණ පරිශීලනයෙන් රසාස්වාදය හා විචාරය පිළිබඳ හැකියාව ප්‍රදර්ශනය කරයි.

## ...ක්‍රියාකාරකම්...

(1)පාඩම හැදෑරීම සහ එහි සම්බන්ධතා හඳුනා ගැනීමට සන්දේශ සාහිත්‍ය ඇසුරෙන් පිළිතුරු සපයන්න.

I. සන්දේශ කාව්‍යය නමින් හැඳින්වෙන්නේ කුමක් ද?
.........................................................................................................................

II. සන්දේශයක් වීමට තිබිය යුතු පොදු අංග කවරේ ද?
.........................................................................................................................

III. සන්දේශ කාව්‍ය ඉතිහාසයෙහි පළමුවරට සන්දේශයක් රචනා කරන ලද්දේ කවුරුන් විසින් ද?
.........................................................................................................................

IV. එම සන්දේශ කෘතිය කුමක් ද?
.........................................................................................................................

V. දැනට විද්‍යමාන පැරණිම සිංහල සන්දේශය කුමක් ද?
.........................................................................................................................

VI. එය රචිත යුගය නම් කරන්න.
.........................................................................................................................

VII. ගම්පොළ යුගයේ පටන් සීතාවක යුගය තෙක් රචිත සිංහල සන්දේශ කාව්‍ය නම් කරන්න.
.........................................................................................................................
.........................................................................................................................

VIII. සන්දේශ කාව්‍යයෙහි ආකෘතික ලක්ෂණ කවරේ ද?
.........................................................................................................................

(2) පාඩම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

I. හංස සන්දේශය අයත් වන සාහිත්‍ය යුගය කුමක් ද?
.........................................................................................................................

II. මේ අවධිය වන විට රජ කළ රජතුමා කවු ද?
.........................................................................................................................

III. හංස සන්දේශය රචනා කළ කවියාගේ නම සඳහන් කරන්න.
.........................................................................................................................

IV. කවියා විසින් රචිත සෙසු සාහිත්‍ය ග්‍රන්ථ මොනවා ද?
.........................................................................................................................

V. හංස සන්දේශය ලිවීමේ අරමුණු ලියන්න.
.........................................................................................................................

VI. හංස සන්දේශය කවුරුන් වෙත යැවෙන්නක් ද?
.........................................................................................................................

VII. මේ වන විට ග්‍රාමවාසී භික්ෂූන් වහන්සේලාගේ ප්‍රධානත්වය දැරූ මා හිමියන්ගේ නම කුමක් ද?
.........................................................................................................................

VIII. වනරතන මාහිමි වැඩ විසූ පිරිවෙනෙහි නම කුමක් ද?

........................................................................................................................................

IX. කැරගලට එම නම ලැබීම පිළිබඳ ව ඇති ජනප්‍රවාද දෙක කුමක් ද?

........................................................................................................................................

X. කෝට්ටේ යුගයේ රචනා වූ අනෙක් සන්දේශ කාව්‍ය කවරේ ද?

........................................................................................................................................

(3) පහත සඳහන් කවි කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

3.1

සාර පලය අඹ දඹ රඹද **<u>වල් පිට</u>**
**<u>මීර ජලය</u>** ඇළ දොළ කඳු පිටින් බට
නැර ලොලය වඩවන දුටු දනන් හට
කැරගලය වැජඹෙයි මේ ලෙසින් සිට

I. කැරගලය සුන්දර සෞභාග්‍යවත් ප්‍රදේශයක් බව කවියා දක්වන්නේ කෙසේ ද?

........................................................................................................................................

II. ඉරි ඇඳි පදවල අරුත් ලියන්න.

........................................................................................................................................

3.2

කුළින් කුළම සිහිලඹ වැහෙන කඳු රැය
දොළින් දොළම කල්යල් කරන කුඹුරුය
පළින් පළ ම තල් පොල් ගෙවතු මැඳුරුය
තළින් තළම පුල් පියුමුපුල පඬෙරුය

I. සැප සම්පතින් ආඪ්‍ය ගමක් බව ප්‍රකාශ වන පැදි උපුටා දක්වන්න.

........................................................................................................................................

........................................................................................................................................

II. මෙහි එන ශබ්දාලංකාර දෙකක් නම් කරන්න.

........................................................................................................................................

3.3

පැසෙයි නිබඳ සුවඳැල් කෙත් වත් අවට
ඇසෙයි ළමා වසු පැටියන් හඬ දුරට
දිසෙයි වෙහෙර එහි සුර විමනක් ලෙසට
රසෙයි අමා රසමය ඒ පියස දුට

I. සුරවිමනක් ලෙස පෙනෙන්නේ කුමක් ද?

........................................................................................................................................

II. මෙහි ඇතුළත් අර්ථාලංකාරයක් නම් කරන්න.

........................................................................................................................................

3.4

**<u>දිමුත්</u>** වෙහෙර වට විසිතුරු මල් ව තු ය
එහිත් සුවඳ මල් නිතිවෙයි **<u>මිණි මුතුය</u>**
මහත් තුරු මියුරු පල ගෙන නැමී අතුය
රගත් සෙවණ නොහැර ම සිටි පොල් වතුය

I. මෙම කවිය නිර්මාණය වී ඇති විරිත කුමක් ද?
..........................................................................................................................................

II. ඉරි ඇඳි පදවල අරුත් ලියන්න.
..........................................................................................................................................

3.5

නොයෙක් තැනම පිපි මල් පිරුණු පොකුණු ය
ගෙයක් **<u>කන ම</u>** සැඳැහෙන් දෙවන **<u>දකුණු ය</u>**
සුදක් ලෙස තිබෙයි මළු මං හැර කුණුය
සියක් අය කෙරෙහි වැඳ පුද පැදකුණු ය

I. අවට පරිසරයේ සුන්දරත්වය හා ජනයාගේ ආධ්‍යාත්මික ගුණය සඳහා නිදසුන බැගින් දක්වන්න.
..........................................................................................................................................

II. ඉරිඇඳි පදවල අරුත් ලියන්න.
..........................................................................................................................................

(4)අර්ථය ලිහිල් බසින් ලියමු.

පළමු තීරුවේ දැක්වෙන වචනවල අර්ථය දෙවැනි තීරුවෙන් තෝරා එහි අංකය අදාළ හිස් තැනෙහි ලියන්න.

| | | | |
|---|---|---|---|
| I. | දඹ | (........) | I. මහී කාන්තාව |
| II. | වල් පිට | (........) | II. සීතල වතුර |
| III. | කඳුරු | (........) | III. එල්ලෙන |
| IV. | සිහිල්’ඹ | (........) | IV. ඉදුණු |
| V. | ලඹ දෙන | (........) | V. වනාන්තරය |
| VI. | මිහිරඹ | (........) | VI. කිරි වතුර |
| VII. | රඹ කැන් | (........) | VII. පියුම් පැණි |
| VIII. | විලිකුන් | (........) | VIII. දියපාරවල් |
| IX. | පොකුරු මී | (........) | IX. ජම්බු |
| X. | මිහඹ | (........) | X. කෙසෙල් කැන් |
| XI. | කිරඹ | (........) | XI. මිහිරි අඹ |
| XII. | දිමුත් | (........) | XII. දන්දීම් |
| XIII. | දකුණුය | (........) | XIII. පිපුණු |
| XIV. | මිණිමුතු | (........) | XIV. බබළන |
| XV. | සුද නොහළ | (........) | XV. සුදු පාට අත් නොහළ |

**(5)විචාර ප්‍රශ්න**

***5.1.'කැරගල වැනුම කවි පෙළ මගින් ශ්‍රී ලංකාවේ පැරණි ගමක සුන්දරත්වය විදහාපායි'***
***උදාහරණ තුනක් ඇසුරින් පැහැදිලි කරන්න.***

*කඳු මුදුන්වලින්ගලා බසින දිය ඇලි පරිසරයට සුන්දරත්වයත් ද කුඹුරුවලට ජලය ද සපයයි. තල් පොල් ගෙවතු සහිත මැදුරු නෙළුම් මානෙල් සහිත පොකුණු ගමට අලංකාරයකි.

කවිය.....................................................

*සාරවත් අඹ, ජම්බු, කෙසෙල් ගස් වලින් පිරුණු වන බිම් වලින් ද කඳුවලින් ද ගලා හැළෙන ඇළ දොළවලින් ද කැරගල ගම සුන්දරත්වයට පත් වී ඇත.

කවිය.....................................................

*නිරන්තරයෙන් පැසෙන සුවඳැල් කෙත් වතු සහිත ගමේ සාරවත් බවත් ළමා වසු පැටියන්ගේ හඬ ඇතට පැතිරෙන බවත් සුරවිමනක් ලෙස විහාරය දිස් වන බවත්දක්වන කවියා පැරණි ගමක සුන්දරත්වය මනාව මතු කරයි.

කවිය.....................................................

***5.2.සැප සම්පතින් ආඪ්‍ය ගමක තොරතුරු කැරගල වැනුමෙන් ඉදිරිපත් වන ආකාරය උදාහරණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.***

*සෑම දොළක් පාසා ම කල්යල් බලා වගා කරන කුඹුරු තල්වතු පොල්වතු සහිත මන්දිර මගින් ගම්වැසියන් ධනයෙන් ආඪ්‍ය බව පෙන්වා දෙයි.

කවිය.....................................................

*නිරන්තරයෙන් ම කෙත්වතුවල සුවඳැල් වී පැසීම, ගව සම්පතින් පොහොසත් වීම තුළ කියාපාන්නේ ගමෙහි කෘෂිකර්මාන්තයේ දියුණුව යි.

කවිය.....................................................

*අඹ, ජම්බු, කෙසෙල් ගස්වලින් පිරුණු සාරවත් වන බිම් මිහිරි දිය පිරුණු ඇළදොළ ගම සැප සම්පතින් ආඪ්‍ය බව දක්වයි.

කවිය.....................................................

***5.3.කැරගල වැනුමෙහි පරිසර වර්ණනාවන්හි විචිත්‍රත්වය උදාහරණ තුනක් දෙමින් පැහැදිලි කරන්න.***

*සෑම කඳු මුදුනක් පාසා ම ජලය වැහෙන දිය දහරා, සරුසාර කෙත්වතු, නෙළුම් මානෙල් පිරුණු විල් අපූරු පරිසරයක් පිළිබඳ චිත්තරූප මවයි.

කවිය.....................................................

*සීතල දිය ඇලි අවට මල් සැදුණු මල් වැල් හා සුදු වැලිතලා, මල් පිපුණු විල් විචිත්‍රවත් පරිසරයක් මවාපායි.

කවිය.....................................................

*කවියා විහාරයේ පරිසරය අපූර්වත්වයෙන් දක්වයි. මල් පිපුණු විල්වල මීමැස්සන් නදදෙයි. සුළඟින් ගස් වල මල් පෙති බිම වැටීම කවියා දක්වන්නේ සුළඟ ඇවිත් මල් පිපුණු ගස්වල මල් පෙති මළුවෙහි අතුරු වන බවයි. අජීවී වස්තූන්ට සජීවත්වයක් ආරෝපණය කරමින් විචිත්‍රවත් ව පරිසරය වර්ණනා කර ඇත.

කවිය.....................................................

***5.4. කැරගල ගම සහ පන්සල අතර ඇති අන්තර් සම්බන්ධතාව කවියා දක්වන ආකාරය උදාහරණ තුනක් ඇසුරෙන් පැහැදිලි කරන්න.***

*සෑම ගෙයක් පාසා ම ශ්‍රද්ධාවෙන් දානය ලබා දෙයි. ගම්වැසියන් විහාරයට ලබා දෙන දානමානවලින් අඩුවක් නැත. එම දාන ලබා දෙන්නේ ද ශ්‍රද්ධාවෙන් යුතුව ය.

කවිය………………………………………………

*විහාර මළුව හා මාර්ග කුණු කසළ ඉවත් කර පිරිසිදු සුදු පැහැයෙන් බබළයි. සියගණන් පිරිස විහාරයට පැමිණ වැඳීම් පිදීම් ප්‍රදක්ෂිණා කරති. ඒ අනුව ගම්වැසියන් විහාරයට දක්වන භක්තිය පැහැදිලි වේ.

කවිය………………………………………………

*විහාරය දකින ජනතාව තුළ සතුටක් ඇති වෙන ආකාරයට සතර පැත්තෙන් එකම අයුරින් සමතලා කර සුදු පැහැති වැලි ඉස විහාර මළුව සුන්දර කර ඇත. පන්සලක් සුන්දර මෙන් ම පිරිසිදු වන්නේ ගමේ ජනතාවගේ අනුග්‍රහයෙනි. ඒ අනුව ගම්වැසියන් කැරගල විහාරය ට දක්වන මනා සැලකිල්ල මින් පැහැදිලි වේ.

කවිය ………………………………………………

***5.5.'වීදාගම හිමියෝ අර්ථ රසය මෙන් ම ශබ්ද රසය ද මනාව සංකලනය කරමින් රසවත් කාව්‍යෝක්ති නිර්මාණය කරති.' උදාහරණ තුනක් දෙමින් විමසන්න.***

අර්ථ රසය

*කවියා යොදා ඇති අවස්ථෝචිත උපමා හේතුවෙන් කැරගල විහාර වර්ණනය රසවත් වී ඇති බව පෙනේ.

+සාරවත් කැරගල ගම්පියසේ පිහිටි විහාරය කවියා දකින්නේ ජනතාවට අමා රසයක් ගෙන දෙන සුරවිමනක් ලෙසිනි.

කවිය………………………………………………

+හංසයාගේ ප්‍රියතම ආහාරය වන කිරිදිය හා මල් පැණි බොන්නා සේ විහාරය නරඹන ලෙස හංසයාට සැල කිරීම.

කවිය………………………………………………

+දුලබ ඉසුරෙන් පිරි කැරගල විහාරය මිහිකතගේ මුහුණට සමාන කිරීම.

කවිය………………………………………………

+විහාර මළුව සුදු වැලි අතුරා සමතලා කර සකස් කර ඇත්තේ බෙර ඇසක් මෙනි.

කවිය ………………………………………………

+සුදු වැලි ඉස කැළි කසළ ඉවත් කර පිරිසිදු ව පවත්වාගෙන යන විහාර මළුව මිහිකතගේ සඳුන් ආලේපිත උර මඩලට සමකර දැක්වීම.

*සරල සුගම භාෂාවක් උපයුක්ත කරගත් හංසයෙහි බොහෝ කවි සංකල්ප රූප මතු කරන කවි වේ. කැරගල ගමෙහි අසිරිය චිත්තරූප මැවෙන ආකාරයෙන් වර්ණනා කර ඇත.

කවිය ………………………………………………

ශබ්ද රසය

*කඳු මුදුනෙන් කඩා හැලෙන දිය දහරාවන්හි හඬ 'ළ' ශබ්දය අනුප්‍රාසාත්මක ව යෙදීමෙන් මතුවෙයි. එයින් ශබ්ද රසය ද අර්ථ රසය ද මනාව ගළපා ඇත.

කවිය………………………………………………

*කවියා අවස්ථානුකූල ව විරිත වෙනස් කරයි. යෝග්‍ය විරිත් තෝරාගනියි. මුල මැද අග තුන් තැන්හිම එළිසමය සහිත මෙම කවිය ශබ්ද රසය තීව්‍ර කරන කවියකි.

කවිය………………………………………………

# පිළිතුරු

(1)

I. කිසිවකු දූත කාර්යයෙහි යොදා සන්දේශයක් සහ නිශ්චිත ස්ථානයකට යවන සේ රචනා කරන කාව්‍ය විශේෂය

II. *සන්දේශය යවන්නා
*සන්දේශය ලබන්නා
*සන්දේශය ගෙනයන්නා
*සන්දේශය

III. භාරතයේ විසූ මහා කවි කාලිදාස

IV. මේඝදූතය

V. මයූර සන්දේශය

VI. ගම්පොළ යුගය

VII. මයූර, තිසර, පරෙවි, කෝකිල, සැළලිහිණි, ගිරා, හංස, සැවුල් යන සන්දේශ

VIII. * දූතයාට ආශිර්වාද කිරීම
* දූතයාව වර්ණනා කිරීම , පැසසුම් කිරීම
* දූත කාර්යය පැවසීම
* වර්ණනා (නගර, රජ, මාර්ග)
* යා යුතු ස්ථානය වර්ණනා කිරීම
* සන්දේශය ලබා ගන්නා වර්ණනා කිරීම
* සන්දේශය පැවසීම
* සුබ පැතීම

(2)

I. කෝට්ටේ යුගය

II. හයවන පරාක්‍රමබාහු රජතුමා

III. වීදාගම මෛත්‍රේය හිමි

IV. බුදුගුණඅලංකාරය, ලෝවැඩ සඟරාව, දහම් ගැට මාලාව, එළු අත්තනගලු වංශය, කවි ලකුණු මිණිමල

V. කැරගල වනරතන හිමියන් ලවා සමන්, විභීෂණ, උපුල්වන් හා කඳකුමරු යන දෙවිවරුන්ට පිරිත් කියා පින් දී එමගින් සිරි පැරකුම්බා රජ කෙරෙහි කරුණාවෙන් සෙත සලසවන ලෙස ඉල්ලීම.

VI. කැරගල පද්මාවතී පිරිවෙන්පති වනරතන හිමියන්ට

VII. කැරගල වනරතන හිමි

VIII. කැරගල පද්මාවතී පිරිවෙන

IX. * මෙය කැරගල නම් පර්වතයක් ආසන්නයේ පිහිටීමත් මෙම පර්වතයෙහි කරකොළ ගස් තිබූ නිසා
* කුර තම්පලා ගස් තිබූ නිසා කුරගල, කැරගල වූ බව

X. පරවි, කෝකිල, සැළලිහිණි, ගිරා සංදේශය

(3)

3.1 I. සාරවත් පලතුරුවලින් සහ කඳු මතින් පහතට ගලා බසින මිහිරි දියෙන් ඇළ දොළ පිරී පවතින නිසා

II. * වනාන්තරය

* මිහිරි ජලය

3.2 I. දොළින් දොළ ම කල්යල් කරන කුඹුරු ය

පළින් පළම තල් පොල් ගෙවතු මැදුරු ය

II. * එළි සමය

* අනුප්‍රාසය

3.3 I. * වෙහෙර

* උපමාලංකාර

3.4 I. සමුද්‍රඝෝෂ විරිත

II. * බබළන / දීප්තිමත්

* පිපුණු

3.5 I. පිපුණු මල්වලින් පිරි පොකුණු / කුණු කසළින් තොර මිදුල් හා පාරවල්

II. * හැම ගෙයක ම ශ්‍රද්ධාවෙන් දන් දීම.

* ජනයා වෙහෙර වැඳ පුදා ගැනීම.

(4)

I. - IX
II. - V
III. - VIII
IV. - II
V. - III
VI. - XI
VII. - X
VIII. - IV
IX. - VII
X. - I
XI. - VI
XII. - XIV
XIII. - XII
XIV. - XIII
XV. - XV